කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

විවෘත සහ දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය
(බාහිර) - 2008

මානවශාස්ත්‍ර පීඨය

ප්‍රතිබිම්බ කලා - IMAT –E1015

**ප්‍රතිබිම්බ කලා පිළිබඳ හැඳින්වීමක්**

ඕනෑම ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි　　　　කාලය : පැය 03 යි

---

01. "ඡායාරූප ශිල්පයේ ආගමනය, තත්කාලීන සමාජයේ සන්නිවේදන හා කලා ශිල්ප භාවිතය වැරගැන්වීමට හේතු විය." මෙම අදහස දෙස් විදෙස් උදාහරණ පාදක කොටගෙන විමසන්න.

02. ඡායාරූප ශිල්පය හදාරන ආධුනිකයෙකුට ඒක කාච ප්‍රතිඡායා (Single Lens Reflex) කැමරාව වඩා සුදුසු වන්නේ මන්දැයි එහි ක්‍රියාකාරිත්වය හා විශේෂතා කෙරෙහි අවධානය යොමු කරමින් පැහැදිලි කරන්න.

03. කෙටි සටහන් සපයන්න.
   I. ජෝශප් නිසෙපෝර් නීප්ස්
   II. පුළුල් කෝණි කාචය
   III. කලු සුදු පටලය
   IV. ත්‍රිපාද පීඨය

04. ශ්‍රමායික ඒක කාච ප්‍රතිඡායා කැමරාවකින් (Manual SLR) රූපගත කිරීමේ දී ඔබ අනුගමනය කරන ක්‍රියාමාර්ගය සවිස්තරාත්මක ව ඉදිරිපත් කරන්න.

05. සිනමා මාධ්‍ය කලාව සහ රූපවාහිනී මාධ්‍ය කලාව එකිනෙකින් වෙනස්වන්නේ කෙසේදැයි පහදා දෙන්න.

06. සාමාන්‍ය ලෝකයෙන් වෙනස් වූ අපූර්වත්වයක් ප්‍රතිබිම්බාත්මක ලෝකයෙන් විදහා දැක්වෙන්නේදැයි සාකච්ඡා කරන්න.

07. ප්‍රවෘත්තිකරණය හා වාර්තාකරණයට වඩා වෘත්තාන්තකරණය ප්‍රේක්ෂක ජනතාවට වඩාත් සමීපවන්නේ දැයි අද්‍යතන ටෙලිනාට්‍ය ආකෘතිය පදනම් කරගනිමින් විමසුමක යෙදෙන්න.

08. සිනමාවේ ඓතිහාසික විකාශනයෙහිලා ආරම්භක අවදිය පිළිබඳ සවිස්තරාත්මක සටහනක් සපයන්න.

*************************